සැ. යු.- 2011.01.21 දින පළවූ අංක 1690 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,691 - 2011 ජනවාරි මස 28 වැනි සිකුරාදා - 2011.01.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 105 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 පෙබරවාරි මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජනවාරි මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# තනතුරු - ඇබෑර්තු

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වාග් චිකිත්සක තනතුරට බඳවා ගැනීම

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් සඳහා වාග් චිකිත්සක තනතුරට පහත සඳහන් සුදුසුකම් ලැබූ ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් මෙහි ඇති ආකෘති පත්‍රය අනුව විය යුතු අතර, 2011.03.15 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "වාග් චිකිත්සක තනතුර" යන්න සඳහන් කළ යුතුය.

02. *වැටුප් ක්‍රමය.*—රු. 15,260-6x180-4x240-11x320-20x360-28,020 (MT5-06-2006(IV)

03. *වයස් සීමාව.*—වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනට රජයේ සේවයේ නියුක්ත නිළධාරීන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

04. *අධ්‍යාපන සුදුසුකම්.*—පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් වාග් චිකිත්සාව පිළිබඳ වසර දෙකක පූර්ණ කාලීන ඩිප්ලෝමා සහතිකය.

05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

(i). මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii). 2007.05.08 දිනැති අංක 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂා පිළිබඳ ප්‍රවීණතාවයක් සේවයට බැදී වසර 05ක් ඇතුළත සමත්විය යුතුය.

06. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය.*—තරග විභාගයක් මගින් ඉහළම ලකුණු ලබා ගන්නා අය තෝරා ගනු ලැබේ. එම තරඟ විභාගය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන අතර, එය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විතය.

| | |
|---|---|
| සාමාන්‍ය දැනීම ලකුණු | 100 |
| අභියෝග්‍යතා පරීක්ෂණය | 100 |

07. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටින අයගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

08. විභාග ගාස්තු ''ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10'' යන ලිපිනයට ලියූ කොළඹ මහ තැපැල් කාර්යාලයෙන් ගෙවිය හැකි මුදල් ඇණවුමක් මගින් රු. 250ක විභාග ගාස්තු සෑම අපේක්ෂකයෙකු විසින්ම ගෙවිය යුතුය. මුදල් ඇණවුම අයදුම්පත සමග එවිය යුතුය. විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

09. ඉල්ලුම්පත් හා ඊට සම්බන්ධ වෙනත් ලියුම් එවිය යුත්තේ, සෞඛ්‍ය ලේකම්ගේ නමට පහත සඳහන් ලිපිනයට මිස මෙම අමාත්‍යාංශයේ සේවයේ නියුතු වෙනත් නිළධාරියෙකු පෞද්ගලිකව අමතා නොවේ.

10. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් බාර නොගන්නා අතර, අයදුම්පත ලැබුණ බව ද දන්වා එවනු නොලැබේ. මෙම දැන්වීමේ අවශ්‍යතාවයන්ට සෑම අතින්ම අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. ඉහත අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම් සපුරා ඇති සහ තරග විභාගයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂිත, අපේක්ෂිකාවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්හට ඉදිරිපත් කරන ලෙස දන්වනු ලබන ලියකියවිලි වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී අවශ්‍ය සහතික වල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර ඉල්ලුම්පත්‍ර පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතුය. පත්වීම ලැබීමෙන් පසු ඉහත කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් දෙනු ලබන පත්වීම අවලංගු කර සේවයෙන් පහ කරන අතර, නැවත රජයේ සේවයට නොගන්නාවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

13. ඉහත පරිදි බඳවා ගනු ලබන සියලුම නිලධාරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටියක රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට ද, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව මඟින් නියම කරනු ලබන ප්‍රතිපත්ති වලට ද, මුදල් හා වෙනත් රෙගුලාසි වලට ද, රජය විසින් වරින් වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

14. මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මගින් ආවරණය නොවන යම් ගැටලු සහගත තත්වයක් උද්ගත වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

වෛද්‍ය රවීන්ද්‍ර රුබේරු,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2011 ජනවාරි මස 10 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
''සුවසිරිපාය'',
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වාග් චිකිත්සක තනතුර සඳහා ආදර්ශ අයදුම්පත්‍ර ආකෘතිය

01. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම :————. මයා/ මිය/ මෙය. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා.- SILVA A. B.
1.2 සම්පූර්ණ නම :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :————. (සිංහලෙන්/දෙමළෙන්)

02. 2.1 ලිපිනය (පෞද්ගලික) :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ලිපිනය (පෞද්ගලික) :————. (සිංහලෙන්/දෙමළෙන්)

2.3 ලිපිනය (රාජකාරී) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 ලිපිනය (රාජකාරී) :————.
(සිංහලෙන්/දෙමළෙන්)

(රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/සංස්ථාවක නියුක්ත නිලධාරියකු ඔහුගේ රාජකාරී ලිපින යෙදිය යුතුය. ලිපිනයෙහි වෙනසක් වේ නම් එය වහාම දැන්විය යුතුය)

03. (3.1) උපන් දිනය

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

3.2 අයදුම්පත්භාර ගන්නා අවසාන දිනට වයස

අවුරුදු | | | මාස. | | | දින | | |

04. ජාතික හැඳුනුම්පත් අංකය :————.

05. ස්ත්‍රී/පුරුෂභාවය :————.

06. අධ්‍යාපන සුදුසුකම් :————.

07. පළපුරුද්ද :————.

*සේවය කළ ස්ථාන* *සේවා කාලය සිට දක්වා*

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තරය :————.
i. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
ii. ලදුපත් අංකය හා දිනය :————.
iii. ගෙවූ මුදල :————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

මෙම ඉල්ලුම් පත්‍රයේ සපයා ඇති විස්තර සත්‍ය බව ද නිවැරදි බව ද මෙයින් සනාථ කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව මා තනතුරට පත් කිරීමෙන් පසු සොයා ගතහොත් එයින් මා තනතුරට නුසුදුස්සකු වන බවත්, කිසිම වන්දියක් නොමැතිව තනතුරෙන් පහ කරනු ලබන බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නිල නාමය :————.

දිනය :————.

01-649

---

**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරි තනතුරු (පිරිමි සහ කාන්තා)**

01. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පිරිමි සහ කාන්තා උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරි/නිලධාරිනී තනතුරු සඳහා 2011 ජනවාරි මස 02 වැනි දින සිට 2011 පෙබරවාරි 02 වැනි දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, ත්‍රිවිධ හමුදාවේ නිත්‍ය සේවයේ අධිකාරී තනතුරු සඳහා බඳවාගන්නා ලදුව උපාධියට නියමිත හමුදා සහ අධ්‍යයන විෂයයන් සාර්ථකව නිමකිරීමට සමත් වන කෙඩෙට් නිලධාරි/නිලධාරිනියන්ට උපාධි පිරිනැමීම සඳහා, 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨ පනත හා එම පනතේ සංශෝධන මගින් බලය පවරා ඇති විශ්වවිද්‍යාලයකි.

03. මෙම උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරි/නිලධාරිනී තනතුරුවලට අදාළ උපාධි පාඨමාලාවන් අතුරින් වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී උපාධි පාඨමාලාව අවුරුදු පහක් (05) ද, ඉංජිනේරු උපාධි පාඨමාලාව අවුරුදු හතරහමාරක් (04 1/2)ද, නීති උපාධි පාඨමාලා අවුරුදු හතරක් (04) ද, වන අතර කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධි පාඨමාලාව, හටකාර්ය කළමනාකණ උපාධි පාඨමාලාව හා සමාජ විද්‍යා උපාධි පාඨමාලාවා සඳහා කාලසීමාව අවුරුදු තුනක් (03) ද වේ.

3.1 උපාධි පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන කෙඩෙට් නිලධාරි/නිලධාරිනියන් ත්‍රිවිධ හමුදාවට අනුයුක්ත කිරීම එම හමුදාවල ඇති පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කොටගෙන සිදුකෙරෙනු ඇත. උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, කෙඩෙට් නිලධාරි/නිලධාරිනියන් ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවුක හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නිත්‍ය බල සේනාවල අධිකාරීලත් තනතුරු සඳහා පත් කරනු ලැබේ.

3.2 නියමිත උපාධි පාඨමාලා සහ හමුදා පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව ඔවුනට අදාළ පරිදි ආරක්ෂක අධ්‍යයනය පිළිබඳ වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී (එම්. බී. බී. එස්.) උපාධිය හෝ, විද්‍යාවේදී (බී. එස්. සී) ඉංජිනේරු උපාධිය හෝ, නීතිවේදී (එල්. එල්. බී.) උපාධිය හෝ, විද්‍යාවේදී (බී. එස්. සී) කළමනාකරණ හා කාර්මික විද්‍යා උපාධිය හෝ, විද්‍යාවේදී (බී. එස්. සී) හටකාර්ය කළමනාකරණ උපාධිය හෝ, විද්‍යාවේදී (බී. එස්. සී.) සමාජීය විද්‍යා උපාධිය පිරිනමනු ලැබේ.

3.3 සියලු උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

3.4 තෝරාගනු ලබන අපේක්ෂකයින් ඔවුන්ගේ සුදුසුකම් වලට අනුකූලව පහත දැක්වෙන උපාධි පාඨමාලාවලින් එකක් හැදෑරිය යුතුය.

(අ). *වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී (එම්. බී. බී. එස්.) උපාධි පාඨමාලාව.*—කාලසීමාව අවුරුදු පහකි (05). (පිරිමි පමණි) *අ. පො. ස. (උ/පෙළ) විභාගය 2010 අධ්‍යන වර්ෂයේ දී,* ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව යන විෂයයන් සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ 03ක් සහිතව ජීව විද්‍යා විෂය ධාරාව හදාරා විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(ආ) *විද්‍යාවේදී (බී. එස්. සී.) සිවිල්/යාන්ත්‍රික/විදුලි හා විද්‍යුත්/නාවුක ඉංජිනේරු/ගගන යාන්ත්‍රික ඉංජිනේරු උපාධි පාඨමාලාව.*—කාලසීමාව අවුරුදු හතරහමාරකි (04 1/2) (පිරිමි පමණි)

අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී ගණිත විෂය ධාරාව හදාරා රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ 03ක් සහිතව විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(ඇ) *නීතිවේදී (එල්. එල්. බී.) උපාධි පාඨමාලාව.—කාලසීමාව අවුරුදු හතරකි. (04) (පිරිමි/කාන්තා)*
අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී පහත සඳහන් විෂයයන් අතරින් විෂයයන් තුනකට (03) අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ 03ක් ලබා විශ්විද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

| | | |
|---|---|---|
| ගණකාධිකරණය | දේශපාලන විද්‍යාව | කෘෂි විද්‍යාව |
| භූගෝල විද්‍යාව | ජීව විද්‍යාව | උසස් ගණිතය |
| ව්‍යාපාර සංඛ්‍යානය | ඉතිහාසය | ව්‍යාපාර අධ්‍යයනය |
| රසායන විද්‍යාව | ආර්ථික විද්‍යාව | භෞතික විද්‍යාව |
| සිංහල/දෙමළ | ඉංග්‍රීසි | තර්කශාස්ත්‍රය සහ |
| ගණිතය/සංයුක්ත | | විද්‍යාත්මක ක්‍රමය |
| ගණිතය | | |

(ඈ) *විද්‍යාවේදී (බී. එස්. සී.) කළමනාකරන හා කාර්මික විද්‍යා උපාධි පාඨමාලාව.*—කාලසීමාව අවුරුදු තුනකි (03). (පිරිමි පමණි)

අ. පො. ස. (උ/පෙළ) විභාගය සඳහා ගණිතය විෂය ධාරාව හෝ ජීව විද්‍යා විෂය ධාරාව හදාරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ 03ක් ලබා විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

(ජීව විද්‍යා විෂය ධාරව හදාරා ඇති අපේක්ෂකයින් අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව හෝ ගණිතය විෂයක් ලෙස හදාරා සමත්ව තිබිය යුතුය.)

(ඉ) *විද්‍යාවේදී (බී. එස්. සී.) හටකාර්ය කළමනාකරණ උපාධි පාඨමාලාව.*—කාලසීමාව අවුරුදු තුනකි (03) (පිරිමි/කාන්තා)
අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී වානිජ්‍යය විෂය ධාරාව හදාරා පහත සඳහන් විෂයයන්ගෙන් තුනක් (03) සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ තුනක් ලබා විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලැබූවන් සඳහා

| | |
|---|---|
| ගණකාධිකරණය | භූගෝල විද්‍යාව |
| ව්‍යාපාර අධ්‍යයනය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය |
| ආර්ථික විද්‍යාව | ව්‍යාපාර සංඛ්‍යානය |
| තොරතුරු තාක්ෂණය | තොරතුරු හා ජනමාධ්‍ය පිළිබඳ අධ්‍යයනය |

(ඊ) *විද්‍යාවේදී (බී. එස්. සී.) සමාජ විද්‍යා උපාධි පාඨමාලාව* .—

කාලසීමාව අවුරුදු තුනකි (03) (පිරිමි/කාන්තා)
පහත සඳහන් විෂයයන්ගෙන් අවම වශයෙන් විෂයයන් දෙකක් (02) සහිතව අ. පො. ස. (උ./පෙළ) විභාගයේ දී විෂයයන් තුනකින් (03) සමත් වූවන් සඳහා

| | |
|---|---|
| - භූගෝල විද්‍යාව | ආර්ථික විද්‍යාව |
| - ව්‍යාපාර අධ්‍යයනය | ව්‍යාපාර සංඛ්‍යානය |
| - දේශපාලන විද්‍යාව | ඉතිහාසය |
| - තොරතුරු තාක්ෂණය | තොරතුරු හා ජනමාධ්‍ය පිළිබඳ අධ්‍යයනය |
| - තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය | ඉංග්‍රීසි |

3.5 තෝරාගනු ලබන කෙඩෙට් නිලධාරි/නිලධාරිනීන් එම පාඨමාලාවට අදාළ පොදු විෂයයන්ට අමතරව ඉංග්‍රීසි, කළමනාකරණය, නීතිය, අන්තර්ජාතික අධ්‍යයනය හා හමුදා විෂයන් ද අනිවාර්යයෙන්ම හැදෑරිය යුතුය.

3.6 මීට අමතරව ශාරීරික වර්ධනය, සරඹ හා අවි පුහුණුව, නායකත්වය ආදිය පිළිබඳවද පාඨමාලා කාලය තුළ දී අඛණ්ඩ පුහුණුවීම් වල යෙදිය යුතුය.

04. කෙඩෙට් නිලධාරි/නිලධාරිනී තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් : අයදුම්කරුවන්

(අ) ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

(ආ) 2011 පෙබරවාරි මස 02 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 22ට නොවැඩි විය යුතුයි.

අධ්‍යාපන සුදුසුකම් :

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා සලකා බැලීමට අවශ්‍ය/අවම සුදුසුකම් සපුරා ඇති බවට (YES) සහතික කිරීම ; සහ

(i) සාමාන්‍ය පොදු පරීක්ෂණයෙන් සමත්වීම

(ii) අවම වශයෙන් අ. පො. ස. (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂා විෂයට සම්මාන (සී) සාමාර්ථයක් ලබා සිටීම.

(ඈ) පහත සඳහන් අවම ශාරීරික මිනුම් (සම්මතයන්) සපුරා ලිය යුතුය.

| | | *පිරිමි* | *කාන්තා* |
|---|---|---|---|
| උස | යුද හමුදා | - 5' 6" | 5' 3" |
| | නාවික හමුදාව | - 5' 6" | |
| | ගුවන් හමුදාව | - 5' 6" | 5' 4" |
| බර | | කිලෝ ග්‍රෑම් 50 | |
| පපුව | | 32" (ප්‍රශ්වාස) | |

*සටහන.*—ක්‍රීඩා හෝ වෙනත් අදාළ විෂයයන් හි සුවිශේෂ කුසලතා දක්වා ඇති අයදුම්කරුවන් සඳහා ඉහත සඳහන් ශාරීරික මිනුම් පිළිබඳ අවශ්‍යතාවයන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අභිමතය පරිදි ලිහිල් කිරීමට අවකාශ ඇත.

(ඉ) මනා සෞඛ්‍ය තත්වයක සිටිය යුතු වේ. ඉහත සඳහන් අවශ්‍යතාවයන්ට අමතරව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා සෑහීමට පත්වන පරිදි වෛද්‍ය පරීක්ෂණයකින් ද සමත් විය යුතුයි.

(ඊ) අවිවාහක විය යුතුවේ. (උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරි/නිලධාරිනියකට පුහුණුවීම් කාලය තුළ දි විවාහවීමට අවසර නොමැති අතර සේවා රෙගුලාසි මගින් අවකාශ සැලසෙනතෙක් විවාහවීමට අවසර දෙනු නොලැබේ.)

5. *සේවා කොන්දේසි.*—තෝරාගනු ලබන අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරී/නිලධාරිනියන් ලෙස බඳවා ගැනේ. ඔවුන් 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨ පනත සහ එම පනතේ සංශෝධනයන්ට ද අනුකූලව පනවන ලද්දා වූ නීති, රෙගුලාසි සහ නියෝගයන්ට යටත් වනු ඇත.

6. බඳවාගනු ලබන කෙඩෙට් නිලධාරී/නිලධාරිනියන් නිත්‍ය සේවාවේ අධිකාරියට පත්කිරීමෙන් පසුව එම සේවාවන්ට අදාළ වන පරිදි අනිවාර්ය සේවා කාලයක් සේවය කරන බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

7. උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරී/නිලධාරියන්ට හිමි වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරී/නිලධාරිනියකට උපරිම වශයෙන් රු. 24,000 ක මාසික වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. මෙයට අමතරව පහත සඳහන් පහසුකම් ද නොමිලේ සලසනු ලැබේ.

(i). ආහාර හා නවාතැන්
(ii). නිළ ඇඳුම්
(iii). අනුගාමික සේවාවන්
(iv). ක්‍රීඩා හා විනෝද පහසුකම්
(v). වෛද්‍ය පහසුකම්

8. ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නිත්‍ය සේවාවන්ට පත්කිරීමෙන් අනතුරුව ඔවුන් තම පදවි වලට අදාළ වන පරිදි එම සේවාවන්ට බලපාන වැටුප් සහ දීමනා සඳහා හිමිකම් ලබනු ඇත.

අ. ලුතිතන් කර්නල්/කොමාන්ඩර්/විංග් කොමාන්ඩර් නිලය දක්වා නිලධාරීන් දැනට ගෙවනු ලබන ඒකාබද්ධ වැටුප් ප්‍රමාණ පහත දැක්වේ.

දෙවන ලුතිතන්/නියමු නිළධාරි - වර්ෂයකට රු. 211,800
වැඩ බලන උප ලුතිතන් - වර්ෂයකට රු. 189,240
ලුතිතන්/උප ලුතිතන් - වර්ෂයකට රු. 275,220 - 30 x 7,740 - රු. 507,420
පියාසර නිළධාරී - වර්ෂයකට රු. 275,220 - 34 x 7,740 - රු. 538,380
කපිතාන්/ලුතිතන් - වර්ෂයකට රු. 321,660 - 24 x 7,740 - රු. 507,420
බලපති ලුතිතන් - වර්ෂයකට රු. 321,660 - 28 x 7,740 - රු. 538,380
මේජර් - වර්ෂයකට රු. 368,100 - 22 x 7,740 - රු. 538,380
ලුතිතන් කොමාන්ඩර් - වර්ෂයකට රු. 352,620 - 20 x 7,740 - රු. 507,420
බලසන නායක - වර්ෂයකට රු. 352,620 - 24 x 7,740 - රු. 538,380
ලුතිතන් කර්නල් - වර්ෂයකට රු. 390,540 - 17 x 9,480 - රු. 551,700
කොමාණ්ඩර් - වර්ෂයකට රු. 362,100 - 15 x 9,480 - රු. 504,300
විංග් කොමාන්ඩර් - රු. 362,100 - 20 x 9,480 - රු. 5,51,700

(ආ) පහත සඳහන් මාසික දීමනාවන් ද ගෙවනු ලැබේ :–
(i). සුදුසුකම් දීමනා
(ii). ආහාර දීමනාව
(iii). ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාවක්
(විවාහක නිලධාරීන්ට පමණක්)
(iv). නිළ ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව

(ඇ) පහත සඳහන් පහසුකම් සපයනු ලැබේ/දීමනා ගෙවනු ලැබේ.

(i). ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලේ නේවාසික පහසුකම්
(ii). කුලී නිවාසයක වාසය කරන විට සීමිත ගෙවල් කුලී
(iii). නිළ ඇඳුම් දීමනා
(iv). විවාහක නිලධාරීන්ට අනුගාමික දීමනා/අවිවාහක නිලධාරීන්ට අනුගාමික සේවය
(v). ඇතුළත විසීමට නියෝග ලැබ සිටින නිලධාරීන්ට රාජකාරී ස්ථානයේ සිට නිවස දක්වා යාමට සහ ඒමට මසකට වරක් රාජකාරී දුම්රිය බලපතක්

9. ශ්‍රී ලංකා යුද, නාවුක සහ ගුවන් හමුදා නිලධාරීන්ගේ වැටුප් හා සේවා කොන්දේසි පහත සඳහන් රෙගුලාසි මඟින් පාලනය වනු ඇත.

(අ). යුද හමුදා/නාවික හමුදා/ගුවන් හමුදා වැටුප් සංග්‍රහය
(ආ). යුද හමුදා/නාවික හමුදා/ගුවන් හමුදා නිලධාරීන් උදෙසා ශ්‍රී ලංකා ගැසට් පත්‍රයේ පළකරනු ලබන වලංගු රෙගුලාසි
(ඇ). ශ්‍රී ලංකා ගැසට් පත්‍රයේ පළකරන වලංගු යුද හමුදා/නාවුක හමුදා/ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය

10. පුහුණුවීම් කාලය තුළ දී උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරීන් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උපකුලපති සහ/හෝ අදාළ හමුදාපතීන් විසින් නියම කරනු ලබන පුහුණුවීම්වල නිරත විය යුතු වේ.

11. පුහුණුව ලබන උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරීන් පුහුණුවීම් සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි ඕනෑම ප්‍රදේශයකට පත්කොට යැවිය හැක.

12 පුහුණුව ලබන උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරීන් ඔවුන් සඳහා වෙන්කොට ඇති නේවාසික ස්ථානයන්හි සිටිය යුතු අතර ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ හෝ අදාළ වෙනත් සේවා ආයතන මගින් පනවන ලද දින චර්යාවන් අනුගමනය කළ යුතුයි.

13 *භාෂා අවශ්‍යතා.* - තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු වස් මේ දක්වා පනවනු ලැබ ඇත්තා වූ ද, ඉදිරියේ දී පනවනු ලැබිය හැක්කා වූ ද, නීතීන්ට අනුකූලව කටයුතු කළ යුතුයි.

14. *අනන්‍යතාවය ඔප්පු කිරීම.*-අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් හෝ තැපැල්පති විසින් නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත හෝ මෝටර් රථවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය පිළිගනු ලැබේ.

15. අයදුම්පත් මෙම විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් අදාළ අයදුම්පත්‍රය ලබාගෙන අයදුම් කළ හැක. මෙම විශ්ව විද්‍යාල වෙබ් අඩවිය www.kdu.ac.lk

16. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් එවීමේ දී ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට රුපියල් හයසීයක (රු. 600) මුදලක් "උපකුලපති, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය" නමින් ලංකා බැංකුවේ මොරටුව "ඉඩම" ශාඛාවේ අංක 9405831 ගිණුමට බැරකර, ඔබවෙත ලැබෙන ලදුපත අයදුම්පත සමග අමුණා එවිය යුතුය. අවශ්‍ය මූලික සුදුසුකම් නොමැති හෝ ඉල්ලුම්පත් නිසි ලෙස සම්පූර්ණ කර නොමැති හෝ මෙහි සඳහන් කොන්දේසි වලට අනුකූල නොවන හෝ අයදුම්පත්, කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙන අතර, අයදුපත් එවීමේදී ගෙවනු ලැබූ මුදල් කිසිදු ලෙසකින් ආපසු ගෙවනු නොලැබේ. තව ද අයදුම්පත සමග රු. 30 (රුපියල් තිහක්)

ක් වටිනා මුද්දර ඇලවූ, තම නම සහ ලිපිනය ලියූ (9" x 4" ප්‍රමාණයේ) ලියුම් කවරයක් ද එවිය යුතුය.

17. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර 2011 පෙබරවාරි මස 02 වැනි දින හෝ එදිනට පෙරාතුව ලැබෙන සේ ''ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, රත්මලාන" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අයදුම් පත්‍රය බහා එවන කවරයේ ඉහල වම් කෙළවරේ ''කෙඩෙට් නිලධාරී තනතුර සඳහා අයදුම්පත'' යනුවෙන් සහ ඉල්ලුම් කරනු ලබන විෂය ධාරාව සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත්‍ර සහ මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල නොවන්නා වූ ඉල්ලුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

18. රාජ්‍ය හෝ සංස්ථා සේවයෙහි නිරත නිලධාරීන්ගේ අයදුම්පත් දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත්කළ යුතු අතර එකී අයදුම්කරු තෝරා ගනු ලැබුවහොත් ඔහු අදාළ තනතුරෙන් නිදහස් කළ හැකි බව සඳහන් අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද තිබිය යුතුය.

19. උප්පැන්න සහතිකය, අ. පො. ස. (සා/පෙළ), අ. පො. ස. (උ/පෙළ) විභාගය සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛනවල සහතික කරන ලද ඡායා පිටපත් සහ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවට (yes)නිකුත් කරන ලද ප්‍රතිඵල සටහනේ පිටපතක් ද අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතුය.

20. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය මගින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් තීරණය කරනු ලබන්නා වූ නිර්ණායකයන්ට අනුකූලව ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති, අයදුම්කරුවන් අතුරින් මූලික තේරීම් කරනු ඇත. මෙසේ තෝරා ගනු ලබන්නා වූ අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් අවශ්‍ය යයි තීරණය කරනු ලබන්නා වූ වෙනත් පරීක්ෂණයන්ට ද පෙනී සිටිය යුතු වේ.

21 සම්මුඛ පරීක්ෂණ සහ වෙනත් පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අපේක්ෂකයින්ට එම පරීක්ෂණ පවත්වනු ලබන ස්ථාන, වේලාවන් හා දින ලිඛිතව දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරන්නට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් මෙම විශ්ව විද්‍යාලය මගින් ගෙවනු නොලැබේ.

22 අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරනු ලබන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුට ඒ පිළිබඳව සහතිකයක් ලබා දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම හෝ නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ කිරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේ ය.

23. අයදුම්පත් ලද බැව් මෙම විශ්ව විද්‍යාලය විසින් දැනුම් දෙනු නොලැබේ. ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් සම්බන්ධව කෙරෙන විමසුම් හෝ ලියකියවිලි ද පිළිගනු නොලැබේ.

ගෝඨාභය නන්දසේන රාජපක්ෂ
ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්
සහ
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල
ආරක්ෂක විශ්ව විද්‍යාලයේ කළමණාකරණ මණ්ඩලයේ සභාපති.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය
උපාධි අපේක්ෂක කෙඩෙට් නිළධාරී තනතුර සඳහා අයදුම්පත

ජා. හැ. අංකය :

ඉල්ලුම්කරනු ලබන විෂය ධාරාව :

| වෛද්‍යවේදී | ඉංජිනේරු | කළමණාකරණ හා තාක්ෂණ විද්‍යාව | නීති | හටකාර්ය කළමණාකරණය | සමාජ විද්‍යා |
|---|---|---|---|---|---|
| | | | | | |

(සුදුසුකම් මත ඔබගේ අභිමතය පරිදි විෂය ධාරාවන් තුනක් 1,2 සහ 3 යනුවෙන් සඳහන් කළ හැකිය)

1. නම
   (අ) සම්පූර්ණ නම : මයා/මෙනවිය

   (ආ) මුලකුරු සහිත නම : මයා/මෙනවිය

2. (අ) ස්ථිර ලිපිනය

   (ආ) ස්ථාවර දුරකථන අංකය ජංගම දුරකථන අංකය

3. උපන්දිනය :

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| | | |

4. 2011.02.02 දිනට වයස :

| වර්ෂ | මාස | දින |
|---|---|---|
| | | |

5 විවාහක/අවිවාහක බව :

| විවාහක | අවිවාහක |
|---|---|
| | |

06. ස්ත්‍රී/පුරුෂ භාවය :

| ගැහැණු | පිරිමි |
|---|---|
| | |

07. ශ්‍රී ලාංකික පුරවැසිභාවය

| උපතින් | ලියාපදිංචි වීමෙන් |
|---|---|
| | |

08. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ.පො.ස. (සා.පෙළ.) විභාගය : (ආ) අ. පො. ස. (උ/පෙළ) විභාගය

පාසලේ නම :————. පාසලේ නම :————.

විභාග අංකය :————. විභාග අංකය :————.

අවුරුද්ද :————. අවුරුද්ද :————.

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. ————. | ————. | 1. ————. | ————. |
| 2. ————. | ————. | 2. ————. | ————. |
| 3. ————. | ————. | 3. ————. | ————. |
| 4. ————. | ————. | 4. සාමාන්‍ය ඉංග්‍රීසි | ————. |
| 5. ————. | ————. | 5. සාමාන්‍ය පොදු පරීක්ෂණය | ————. |
| 6. ————. | ————. | 6. 'Z' ලකුණ | ————. |
| 7. ————. | ————. | | |
| 8. ————. | ————. | | |
| 9. ————. | ————. | | |

විශ්ව විද්‍යාලය ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබේද?

| ඔව් | නැත |
|---|---|
| | |

අ. පො. ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂය සඳහා ලබාගත් ඉහලම සාමාර්ථය (i). විභාග අංකය :————.

(ii). අවුරුද්ද :————.

| 09. ක්‍රීඩා කුසලතා | * SL | * ZL | * NL | * INL |
|---|---|---|---|---|
| 1. මලල ක්‍රීඩා | | | | |
| 2. බැඩ්මින්ටන් | | | | |
| 3. පැසිපන්දු | | | | |
| 4. ක්‍රිකට් | | | | |
| 5. හොකී | | | | |
| 6. රගර් | | | | |
| 7. පාපන්දු | | | | |
| 8. පිහිනුම් | | | | |
| 9. ටේබල් ටෙනිස් | | | | |
| 10. ටෙනිස් | | | | |
| 11. වොලිබෝල් | | | | |
| 12. මල්ලව පොර | | | | |
| 13. කරාටේ | | | | |
| 14. ජූඩෝ | | | | |
| 15. බොක්සින් | | | | |
| 16. ස්කොෂ් | | | | |
| 17. | | | | |
| 18. | | | | |

*SL-පාසැල් මට්ටම *ZL-කලාප මට්ටම

*NL-ජාතික මට්ටම *INL-අන්තර් ජාතික මට්ටම

10. බාහිර ක්‍රියාකාරකම් :

| | |
|---|---|
| 1. කැඩෙට් | |
| 2. බාල දක්ෂ | |
| 3. ශිෂ්‍ය නායක | |
| 4. විදුහල් නායක | |
| 5. නිවාස නායක | |
| 6. සංගීත කණ්ඩායම් සාමාජික | |
| 7. සමාජයීය ක්‍රියාකාරකම් | |
| 8. ප්‍රථමාධාර | |
| 9. | |
| 10. | |

11. ශාරීරික යෝග්‍යතාවය :

| උස | | බර | දෘෂ්ටිකත්වය | | | පපුව |
|---|---|---|---|---|---|---|
| අඩි | අඟල් | රාත්තල් | දකුණු | වම් | කණ්නාඩි පැලැඳ | අඟල් |
| | | | | | | |

12. වෙනත් දක්ෂතා :————.
(අවශ්‍ය නම් ඇමුණුමක් සම්බන්ධ කළ හැක)

13. ඔබ පිළිබඳව විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ විස්තර :

i.

| නම | තනතුර | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|
| | | | |

ii.

| නම | තනතුර | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|
| | | | |

14. "උපකුලපති ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය "නමින්" ලංකා බැංකුවේ, මොරටුව, "ඉඩම ශාඛාවේ" අංක 9405831 දරන ජංගම ගිණුමට ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් රුපියල් හයසියයක් (රු. 600) බැර කර පහත සඳහන් විස්තර සඳහන් කරන්න. (මුදල් ගෙවූ ලදුපත මෙම ඉල්ලුම්පත සමග අමුණා එවිය යුතුය.)

(i). මුදල් ගෙවූ දිනය :————.

(ii). මුදල් ගෙවූ ලංකා බැංකු ශාඛාව :————.

15. මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීම අනුව සත්‍ය හා නිවැරදි බැව් ගෞරවයෙන් යුතුව ප්‍රකාශ කරමි. තව ද මෙම ඉල්ලුම් පත්‍රයේ ම විසින් දක්වා ඇති තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා මෙම තනතුර සඳහා නුසුදුස්සෙකු වන බවත් තෝරා ගැනීමෙන් අනතුරුව අනාවරණය වුවහොත් මාහට කිසිම වන්දියකින් තොරව මෙම තනතුර අහිමි වන බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

01-644